ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
LAND COMMISSIONER'S DEPARTMENT

No.7, Gregory's Avenue, Colombo 07
Email: landcom@sltnet.lk

2004/06

MY NO: 4/10/වතුලේඛ

YOUR NO:

DATE: 2004.11.25

සියළුම පළාත් ඉඩම් කොමසාරිස් වරුන් වෙත,

## අනවසරයෙන් භුක්ති විඳින ඉඩම් සඳහා දීර්ඝ කාලීන බදු දීමේදී බදුදෙන දිනය තීරණය කිරීම.

දීර්ඝ කාලයක් තිස්සේ රජයේ ඉඩම් වල අනවසරයෙන් පදිංචිව සිටින පුද්ගලයන් සඳහා දීර්ඝ කාලීන බලපත්‍ර ලබාදීමේදී එම ඉඩම් වල තක්සේරුව ලබා ගැනීමේ පදනම් වර්ෂය ලෙස 1995.06.15 දිනය සඳහා යොදා ගැනීමට කෘෂිකර්ම,පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග ලේකම්ගේ අංක. එල්ඩී/4/3/1/1 හා 2004.11.22 දිනැති ලිපියෙන් අනුමැතිය ලැබී ඇත.

එහෙයින් දැනටමත් දීර්ඝ කාලීන බදුකර නිකුත් කිරීමට අනුමැතිය ලැබී ඇති එහෙත්, දීර්ඝ කාලීන බදුකර නිකුත් කර නොමැති අනවසර කරුවන්ගේ ඉඩම්ද ඇතුළුව සියළුම අනවසර ඉඩම් සඳහා දීර්ඝ කාලීන බදුකර නිකුත් කිරීමේදී ඒවායේ තක්සේරු වර්ෂය ලෙස 1995 වසර යොදා ගැනීමට කටයුතු කරන්න.

එසේම එම දීර්ඝ කාලීන බදුකර වල ආරම්භක වර්ෂය ලෙස 1995 වර්ෂය ම යෙදීම සුදුසු වේ.

එස්.ජේ.පතිරණ,
ඉඩම් කොමසාරිස්.

පිටපත.

1 ප්‍රාදේශීය කාර්යාල වල මාණ්ඩලික නිලධාරීන් දැ.ස.
2 ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරීන් සහ ඉඩම් අංශයේ විෂය ලිපිකරුවන් දැ.ස.